# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/56 - 2022 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2022.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(4) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, විදුලිබල හා බලශක්ති කැබිනට් අමාත්‍යවරයා ලෙස මාගේ පූර්ණ අධීක්ෂණයට සහ මඟපෙන්වීමට යටත්ව, මා විසින්, විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යවරුන්ට විෂයයන් සහ කාර්යයන් පැවරීම, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**ගරු ඩී. වී. චානක මැතිතුමා, විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍ය**

1. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව/ලංකා ඛනිජ තෙල් තොග පර්යන්ත සමාගම

- ඉන්ධන ආනයනය
- ඉන්ධන ඇනවුම් කිරීම
- ගුවන් යානා ඉන්ධන ආනයනය
- පිරිපහදුවේ කටයුතු ක්‍රියාත්මක කිරීම
- පිරිපහදුව වෙනුවෙන් නව ආයෝජන දිරිගැන්වීම
- නව පිරිපහදු ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම
- නව සැපයුම්කරුවන්ට දේශීය වෙළඳපොල විවෘත කිරීම
- පවතින පිරවුම්හල් අධීක්ෂණය සහ නව ඉන්ධන පිරවුම්හල් ආරම්භ කිරීම

2. ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත සමාගම

- තෙල් ටැංකි සංකීර්ණය වැඩිදියුණු කිරීම
- නව ආයෝජන දිරි ගැන්වීම

3. ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය

- ශ්‍රී ලංකාවට අයත් මුහුදු සහ භූමිය තුළ තෙල් සහ ගෑස් ගවේෂණය පිළිබඳව නියාමනය
- නව ආයෝජන ක්‍රියාත්මක කිරීම
- බලශක්ති කේන්ද්‍රයක් ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම

4. ලංකා විදුලිබල මණ්ඩලය/සුනිත්‍ය බලශක්ති අධිකාරිය

- මහා පරිමාන ආයෝජන දිරිගැන්වීමෙන් රටේ විදුලි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, ආයොජන, LNG ව්‍යාපෘති සහ රටට අවශ්‍ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- දැනටමත් අත්සන් කර ඇති ගිවිසුම් සහ යෝජනා අනුව කටයුතු කිරීම

5. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සිදුකරන වැඩසටහන් අධීක්ෂණය සහ එම සියලු ආයතනවල අධීක්ෂණ කටයුතු සිදු කිරීම

**ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා, විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍ය**

1. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව/ලංකා ඛනිජ තෙල් තොග පර්යන්ත සමාගම

- ඉන්ධන බෙදා හැරීමේ ක්‍රියාවලිය සහ ගබඩා කිරීම විධිමත් කිරීම
- ජාතික ඉන්ධන අවසරපත් ක්‍රමවේදය වැඩිදියුණු කිරීම
- කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, වැවිලි කර්මාන්තය, බලශක්ති ක්ෂේත්‍රය, පොදු ප්‍රවාහනය හා අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය ඉන්ධන බෙදා හැරීම විධිමත් කිරීම සහ අධීක්ෂණය
- පෞද්ගලික පාරිභෝගික ඉන්ධන ගබඩා ටැංකි නියාමනය සහ ඉන්ධන බෙදා හැරීම

2. සීමාසහිත ගල් අඟුරු (පුද්ගලික) සමාගම

- ගල් අඟුරු ප්‍රසම්පාදනය, ගල්අඟුරු අවශ්‍යතාවය සැපයීම හා ගල්අඟුරු සමාගම අධීක්ෂණය

3. ලංකා විදුලිබල මණ්ඩලය/සුනිත්‍ය බලශක්ති අධිකාරිය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම/සීමාසහිත එල් ටී එල් (LTL) හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම/ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය/ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

- වහලය මත සූර්ය පැනල මගින් විදුලි උත්පාදනය
- කුඩා පරිමාණ විදුලි බලාගාර සහ ව්‍යාපෘති දිරිගැන්වීම සහ අධීක්ෂණය
- දැනට විදුලිබල මණ්ඩලය සතුව පවතින සියලුම බලාගාර අධීක්ෂණය

- අඩු ආදායම්ලාභී පවුල් සහ ආගමික සිද්ධස්ථාන වෙනුවෙන් සූර්ය පැනල වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම සහ අධීක්ෂණය
- ලංකා විදුලි (පුද්ගලික) සමාගම/සීමාසහිත එල් ටී එල් (LTL) හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම/ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය/ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව යන ආයතනයන් අධීක්ෂණය

4. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සිදුකරන වැඩසටහන් අධීක්ෂණය සහ එම සියලු ආයතනවල අධීක්ෂණ කටයුතු සිදු කිරීම

EOG 10 - 0127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.